ලංකාවට Online

# සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය

(නව විෂය නිර්දේශය)

**ii පත්‍රය**

ඒකකය 07

## නිර්මාණාත්මක සන්නිවේදනය

නව ප්‍රශ්න සැකසුම - **සංජීව ක්‍රිෂාන්ත රණසිංහ**

කාලය පැය තුනයි.

**01)**

(i) ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය දක්වන ආකාරයට රූපවාහිනිය නිර්වචනය කරන්න.

(ii) ශ්‍රව්‍ය විදුලි මාධ්‍යයේ ලක්ෂණ **හතරක්** ලියා ඉන් **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

(iii) රූපවාහිනී මාධ්‍යයේදී ඉදිරිපත් කෙරෙන වැඩසටහන් ආකෘති **හතරක්** දක්වා ඒවා යහපත් හා අයහපත් ලෙස සමාජයට බලපෑම් කරන අයුරු උදාහරණ එක බැගින් ගෙන පැහැදිලි කරන්න.

(iv) නිර්මාණාත්මක සන්නිවේදනයේ අවශ්‍යතාවය හා වැදගත්කම පිළිබඳ කරුණු **හතරක්** ඔස්සේ සඟරාවකට ලිපියක් සකස් කරන්න. (වචන 150ට නොඅඩු)

**02)**

(i) ශ්‍රව්‍ය විදුලි මාධ්‍ය යන්න කෙටියෙන් හඳුන්වන්න.

(ii) ඒ ඒ මාධ්‍යයට අනුව භාෂා භාවිතය විවිධ ස්වරූප ගන්නා ආකාරය **උදාහරණ දෙකක්** ඇසුරින් දක්වන්න.

(iii) නිර්මාණාත්මක චින්තනය යන්න හඳුන්වා එය මානව සංහතියේ ආරම්භයේ සිට වර්තමානය දක්වා පැවති ගමන් මග කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) රූපවාහිනී මාධ්‍යයේ කාටූන් වැඩසටහන් දරුවන්ට අයහපත් ලෙස බලපාන අයුරු විල්බර් ශ්‍රාම්ට අනුව කරුණු **තුනක්** ඔස්සේ පැහැදිලි කරන්න.

**03)**

(i) නිර්මාණශීලිත්වයේ මූලිකාංග **හතර** ලියා දක්වන්න.

(ii) ජේම්ස් වොට්සන් දක්වන ආකාරයට සන්නිවේදනය හා නිර්මාණශීලීත්වය යන්න කරුණු **හතරකින්** දක්වා, ඉන් **එකක්** පිළිබඳ පැහැදිලි කරන්න.

(iii) රූපවාහිනී ටෙලි නාට්‍යයක් හෝ චිත්‍රපටයක් නිර්මාණය කිරීම සාමූහික කර්තව්‍යයකි. එය කරුණු **හතරක්** ඔස්සේ පැහැදිලි කරන්න.

(iv) **වර්තමානයේදී රූපවාහිනියේ ආගමනය සිනමාව බිඳවැටීමට හේතුවකි.** යන මාතෘකාව ඔස්සේ පුවත්පතකට කතුවැකියක් සකස් කරන්න.

**04)**

(i) නිර්මාණාත්මක සන්නිවේදනය යන්න කෙටියෙන් හඳුන්වන්න.

(ii) රූපවාහිනිය ශ්‍රව්‍යවිදුලියට සාපේක්ෂව චමත්කාර ජනක මාධ්‍යයක් වන්නේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

(iii) රූපවාහිනී මාධ්‍ය යන්න කෙටියෙන් හඳුන්වන්න.( උදාහරණ සහිතව)

(iv) සාම්ප්‍රදායික කලා හා ජනශ්‍රැති අංග වර්තමාන සමාජ ප්‍රගමනයට, සංවර්ධනයට යොදාගත හැකි අයුරු උදාහරණ **හතරක්** ඇසුරින් පැහැදිලි කරන්න.

SanjeewaKrishantha Ranasinghe



*"ඔබ නොකියවූ රොමෑන්ටික් කවිය"*

**රොටරි - නුගේගොඩ / සියැස්රෝ - රත්නපුර / වික්ටරි - බලංගොඩ / සක්සස් - පැල්මඩුල්ල** *සංජීව ක්‍රිෂාන්ත රණසිංහ*

**05)**

(i) රූපවාහිනි හා සිනමා සංස්කරණය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) රූපවාහිනි මාධ්‍යයේ ලක්ෂණ **හතරක්** ලියා **දෙකක්** පැහැදිලි කරන්න.

(iii) කැමරා රූප **තුනක්** දක්වා ඒවා රූපවාහිනී හා සිනමා මාධ්‍යයේදී යොදාගත හැකි අවස්ථා උදාහරණ ඇසුරින් දක්වන්න.

(iv) ගෝලීයකරණය නිසා ජනමාධ්‍ය ඒකාකෘතිකරණය වීම කරුණු **හතරක්** ඔස්සේ හුවා දක්වන්න.

Sanjeewa Krishantha Ranasinghe

070 31 98 591 / 077 45 17 280

070 31 98 591

Sanjeewa Krishantha Sanjeewa Krishantha